ජාත්‍යන්තර
කම්කරු
සංවිධානය

# ජාත්‍යන්තර කම්කරු සංවිධානය

*සමාජ සාධාරණත්වය වෙනුවෙන් 90 වසරක මෙහෙය*





ආසියානු
සුනිසි මෙහෙවර
දශකය
2006
2015

සුනිසි මෙහෙවර

යහපත් ලොවක ඇරඹුම

90 වසරක සමාජ සාධාරණත්වය සඳහා මෙහෙය




ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ
ආසියා ශාන්තිකර කලාපීය කාර්යාලය,
එ ජා ගොඩනැගිල්ල, රජ්ඩම්හර්න් පාර,
බැංකොක් 10200, තායිලන්තය.

දුරකථන : 66 2288 1234
ෆැක්ස් : 66 2288 3062

ඊමේල් : BANGKOK@ilo org
www.ilo.org/asia



Designed & Printed by: General Printing Services (Pvt) Ltd. Tel: 011-2385945

## ජාත්‍යන්තර කම්කරු සංවිධානය

සමාජ සාධාරණත්වය හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මානව හා කම්කරු අයිතීන් සුරක්ෂිත කොට ප්‍රවර්ධනය කිරීම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ජා.ක.ස.) මෙහෙයවේ. සෑම අයෙකුටම ස්වාධීන, සමාන ලෙස සැලකෙන, ආරක්ෂිත හා මානව ගරුත්වය ආරක්ෂා වන රාජකාරි පරිසරයක් තුළ සිය සේවාවන් සැලසීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම එහි මුඛ්‍ය අරමුණ වේ. සියල්ලන්ට සුනිසි සේවා පරිසරයක් නිර්මාණය කරදීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයට ක්‍රමෝපායයන් හතරක් ඇත. ඒවා නම් :

- සේවා ස්ථානයේ තත්ත්වයන් මූලික ප්‍රතිපත්ති හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම.
- කාන්තාවන්ට හා පුරුෂයින් හට සුනිසි රැකියා අවස්ථා වැඩි වශයෙන් නිර්මාණය කර දීම.
- සමාජ ආරක්ෂණ ආවරණය හා ඵලදායිතාවය වර්ධනය කිරීම.
- සේවක සේව්‍ය දෙපක්ෂය හා රජය අතර සබඳතාවය ශක්තිමත් කිරීම හා සමාජ කථිකාව දිරිමත් කිරීම.

සේවකල සේව්‍ය දෙපක්ෂය හා රජය සමාන පාර්ශ්වයන් ලෙස ක්‍රියාත්මක වීමේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ත්‍රයි පාර්ශ්වික ව්‍යුහයල එක්සත් ජාතීන්ගේ සංවිධාන තුළ සුවිශේෂී ක්‍රමවේදයක.

## ජාත්‍යන්තර කම්කරු සංවිධාන ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයන්

1919 - ජාත්‍යන්තර කම්කරු සංවිධානය පිහිටුවීම පලමුවන ලෝක යුද්ධය අවසන් කොට මිත්‍ර රාජ්‍යයන් සමූහය ආරම්භ කරන ලද වර්සේලස් ගිවිසුම විසින් මෙම සංවිධානය නිර්මාණය කරන ලදී.

1926 - ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

1944 - ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලික ප්‍රතිපත්ති ඇතුලත් කරමින් ෆිල්ඩෙල්ෆියා ප්‍රකාශය පිළිගැනීම.

1946 - අභිනවයෙන් ආරම්භ කරන ලද එක්සත් ජාතින්ගේ සංවිධානයේ ප්‍රථම විශේෂඥ ආයතනය බවට ජාත්‍යන්තර කම්කරු සංවිධානය පත්වෙයි.

1969 - සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම හා ජාතීන් අතර සාමය ගොඩනැගීම වෙනුවෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය නොබෙල් සාම ත්‍යාගයෙන් පිදුම් ලබයි.

1998 - සේවා ස්ථානයේ මූලික ප්‍රතිපත්ති හා අයිතීන් පිළිබඳ ප්‍රකාශය පිලිගැනෙයි.

1999 - සිය ඓතිහාසික බලසීමාවේ කාලින ප්‍රකාශනය ලෙස යහපත් රාජකාරි සංකල්පය ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් පිළිගන.

2004 - ගෝලීයකරණයේ සමාජ පැතිකඩ පිළිබඳ ජාත්‍යන්තර කොමිසම සාධාරණ ගෝලීයකරණයක් තුළින් සැමට ඉඩ ප්‍රස්ථා නමින් සිය වාර්තාව එළිදක්වයි.

2006 - යහපත් හා සුනිසි රැකියා දශකයක් හා වසර 2015 වන විට සැමට පූර්ණ ඵලදායී හා සුනිසි සේවා අවස්ථා සලසා දීමේ ඉලක්කය වෙනුවෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආසියා ශාන්තිකර සාමාජිකයෝ කැප වෙත.

2008 - සුනිසි සේවා න්‍යාය පත්‍රය හරහා ගෝලීය අභියෝග ජයගැනීම සඳහා වන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සමාජ සාධාරණත්වය හා සාධාරණ ගෝලීයකරණ ප්‍රකාශය ලෝක කම්කරු කොමිසම පිළිගනී.

## ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමාජ සාධාරණත්වය වෙනුවෙන් 90 වසරක මෙහෙය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රධානතම ශක්තිය වන්නේ සමාජ සාධාරණත්වය පිළිබඳ පණිවුඩය දැනට වසර 90කට පෙර මෙන්ම අදටත් එලෙසම වලංගුව හා අදාලව පැවතීමය. අප සියළු දෙනා විවිධ වූ රාජකාරිවල යෙදී සිටි නමුත් අපගේ අපේක්ෂාව වන්නේ වඩා හොඳ තත්ත්වයන් හා ප්‍රමිතීන් යටතේ සේවයේ යෙදීමට අවස්ථාව සලසා ගැනිමයි.

සොචිකෝ යමාමොටෝ
කලාපීය අධ්‍යක්ෂල ජාත්‍යන්තර කම්කරු සංවිධානය ආසියා ශාන්තිකර කලාපීය කාර්යාලය

1919 දී පිහිටුවන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානය 90 වන සංවත්සරය එහි සාමාජිකයන් විසින් 2009 වසරේදී සමරනු ලබයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පැරණිතම විශේෂඥආයතනය වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය. 1919 දී වර්සෙයිලස් ගිවිසුම විසින් ස්ථාපිත කරනු ලැබූ ආයතන අතුරින් ඉතිරිව පවතින එකම ආයතනයද වේ.

අනෙකුත් කලාපවල මෙන්ම ආසියා ශාන්තිකර කලාපයේද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 90 වන සංවත්සරය අප්‍රේල් මස 21 වන දින සිට 28 වන දින දක්වා කාලය තුළ (ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මුල්ම ව්‍යවස්ථාව අනුමත කරන ලද්දේ 1919 අප්‍රේල් 28 වනදාය). විවිධ වූ ක්‍රියාකාරකම් දාමයක් හරහා අති උත්කර්ශවත් අන්දමින් සැමරීමට සැලසුම් කොට ඇත. සමාජ සාධාරණත්වය වෙනුවෙන් 90 වසරක මෙහෙය යන තේමාව ඔස්සේ උක්ත ක්‍රියාකාරකම් සිදු කෙරෙන අතර ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහාය මත එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පාර්ශවකරුවන් ත්‍රිත්වය විසින් මෙම කටයුතු සංවිධානය කරනු ලබයි.

සුනිසි මෙහෙවර
යහපත් ලොවක ඇරඹුම
90 වසරක සමාජ සාධාරණත්වය සඳහා මෙහෙය

එක් එක් සාමාජික රට විසින් ස්වකීය සන්දර්භයන්ට අදාල ක්‍රියාකාරකම් සංවිධානය කරනු ලැබුවත් සෑම අංගයකම අරමුණ වන්නේ ලෝක ජනතාවගේ ජීවිත වඩාත් හොඳ මට්ටමකට ගෙන ඒම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් කරන ලද දැවැන්ත මෙහෙය ජනතා අවධානයට ගෙන ඒමයි.

එසේම සාධාරණ ගෝලීයකරණයක අවශ්‍යතාව යහපත් සේවා පරිසරය මූල්‍ය අර්බුදය ශක්තිමත් ආර්ථික හා සමාජ සංවර්ධන ප්‍රතිපත්තිය වැනි කාලීන වශයෙන් වැදගත් වන විෂයයන් පිළිබඳ කථිකාවක් ඇති කර ගැනීමටද ඉන් අවස්ථාව සැලසේ.

ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණ වැඩමුළු රැස්වීම් ප්‍රදර්ශන සංස්කෘතික සංදර්ශන මිනි මැරතන් ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන් පුවත්පත් අතිරේක රචනා ඡායාරූප හා චිත්‍ර ප්‍රදර්ශන මෙන්ම අනුස්මරණ මුද්දරයක් නිකුත් කිරීම ආදී ඉසව් ගණනාවක් ජාතික මට්ටමින් සැලසුම් කොට ඇත.

